
# A VACCINE FOR IMMUNISATION OF CATTLE AND BUFFALOES AGAINST HAEMORRHAGIC SEPTICAEMIA

*M C L de Alwis*

To protect cattle and buffaloes from Haemorrhagic Septicaemia disease, oil adjuvent, as well as Alum precipi tated vaccines, were used in the past. Experiments in other countries have shown that the oil adjuvent vaccine gives protection to cattle and buffaloes for 11-18 months while Alum precipitated vaccine was effective only for 4-6 months.

Production of oil adjuvent vaccine in Sri Lanka was discontinued 10 years ago, due to difficulty of obtaining the particular type of oil. Thereafter only the Alum pre cipitated vaccine was produced. Recently numerous instan ces had been recorded, where this vaccine failed to ade quately immunise buffaloes. In some places disease out break occured as early as 6 weeks to 3 months after vacci nation.



Now, (using Lanka white oil BP-P 524) an oil adjuvent vaccine is being produced locally. Vacci- nate 4 -5 month old calves and there after annually, to immunise them against H.S.disease.

The oil adjuvent vaccine is a thick emulsion. It is diffi cult to administer, unlike the alum vaccine. Therefore use a guage 14 or 15 needle in a nylon syringe, for administration of the oil aduvent vaccine. The vaccine (like other vaccines) must be stored in a refrigera tor, but it must be placed at room temperature for at least 12 hours befure use.

The H.S. oil adjuvent vaccine for immunisation of cattle and buffaloes is now available for use at the Veterina ry Vaccine Production Centre, Peradeniya.

## රක්තාශ්‍රැව රෝගය වලක්වන නව එන්නත් සාරයක්

එල හරකුන් සහ මී ගවයන්, රක්තාශ්‍රැව රෝගයෙන් ආරක්ෂා කර ගැනීමට තෙල් හා සංයුක්ත එන්නත් සාරයක් සහ ඇලම් ආශ්‍රිත - එන්නත් සාර භාවිතා කරන ලදී. තෙල් හා සංයුක්ත එන්නත් සාර භාවිතයෙන්, මාස 11 සිට 18 දක්වා කාලයක්, ගවයන් ආරක්ෂා කර ගත හැක. අනෙත් එන්නත් සාර වර්ගය භාවිතයෙන් සති 6 සිට මාස 3 අතර කාලයේ දී පවා, එන්නත් කළ ගවයන්ට රෝගය වැලදෙන බව පෙනී-ගියේ ය.

ලංකා ඛනිජ තෙල් මණ්ඩලය අලෙවිකරන බී.පී.-පී.524 තෙල් වර්ගය උපයෝගී කරගෙන පේරාදෙනියේ, එන්නත් සාර නිෂ්පාදන මධ්‍යස්ථානයේ නිපදවන ලද තෙල් හා සංයුක්ත එන්නත් සාරය මාස 10 කට අධික කාලයක්, රෝගය සඳහා ප්‍රතිශක්තිකරණය ලබාදෙන බව පෙනී ගොස් ඇත.

මාස 4 සිට 5 දක්වා වයසැති වසු පැටවුන් පළමුවරට එන්නත් කර, ඉන්පසු අවුරුද්දකට වරක් එන්නත් කිරීමෙන්, එම සතුන් රක්තාශ්‍රැව රෝගයෙන් බේරා ගත හැක.

මෙම එන්නත් සාරය ශීත කරණයක ගබඩා කළ යුතුය. එන්නත් කිරීමට පෙර අඩු වශයෙන් පැය 12 කට පෙර ශීත කරණයෙන් ඉවත්කර කාමරයේ ඇති උෂ්ණත්වය යටතේ තබාගැනීමටත්, එන්නත් කිරීමට ගේජ් 14 හෝ 15 කටුවක් යෙදූ නයිලෝන් සිරිංජයක් භාවිතා කිරීමත් අවශ්‍යයි. හේතුව මෙම එන්නත් සාරය උකු තෙලෝදයක් වීමය.

මෙම එන්නත් සාරය පේරාදෙනියේ පශු එන්නත් සාර නිෂ්පාදන මධ්‍යස්ථානයෙන් ලබාගත හැක.